# ඉන්දියාව වඩා යහපත් දේශයක් - ඔහු නොසිටියානම්

සනාල් එිදමරුකු
සභාපති, ඉන්දීය හේතුවාදී සංගමය සහ
හේතුවාදී ජාත්‍යන්තරය.

අද උදෑසන (2011 අප්‍රේල් 24) අසූ පස් වියැති සත්‍ය සායි බාබා මිය ගියේ හාස්කම් සහ අනාගත වාක්‍ය අසාර්ථක බව නැවත වතාවක් ඔප්පු කරමිනි. තමා වයස අනූ හයේදී පමණක් මිය යන බව පුත්ත පාර්ති හී පිහිටි තම මූලස්ථානයේදී 2000 වසරේදී පැවති මහජන රැස්වීමකදී ඔහු අනාවැකි පළකළ අතර බොහෝ අවස්ථාවල එය නැවත නැවතත් ප්‍රකාශ කර තිබුණි. මේ නිසා බොහෝ භක්තිමත් අනුගාමිකයෝ ඔහුගේ වචනය විශ්වාස කළ අතර යම් අසිරිමත් දෙයක් සිදුවන තුරු අවසන් මොහොත දක්වාම බලා සිටියහ. මෙය ඔහු විසින් නොමග යවා මුලා කරන ලද දශ ලක්‍ෂ ගණන් රැවටෙන සුළු ජනතාවගේ ඇස් ඇරවන්නක් වනු ඇත.

මියගිය කෙනෙකුගේ හොඳ මිස වැරදි ගැන කතා නොකළ යුතු බවට ලතින් කියමනක් ඇත. එහෙත් මා සිතන පරිදි සායි බාබා සිද්ධිය එම සම්ප්‍රදාය ඉක්මවා යාමට සුදුසුය. ඔහු ඉන්දියාවට කල හානිය සුවිශාලය. බුද්ධියට සහ විද්‍යාත්මක පන්නරයට එරෙහිව ඔහුගෙන් වූ විනාශකාරී බලපෑම් රට විශාල පසුබෑමකට හේතු විය. විද්‍යාවේ දියුණුව විසින් සුවිසල් සමාජ හා ආර්ථික වර්ධනත් මුලු මහත් ඉන්දියාව පුරා විද්‍යාවේ අවදිවීම පටන් ගැනීමත් සිදුවුන යුගයක සත්‍ය සායි බාබා මිත්‍යාවේ ප්‍රතිවිප්ලවයක් දියත් කළේය. වගකීමක් නැති දේශපාලකයන්ගේත් අනෙකුත් ප්‍රසිද්ධ පුද්ගලයන්ගේත් සහයෝගය ඔහුට ලැබුණි. මගේ තීන්දුව මෙය ඔහු කල විශාලතම අපරාධය බවයි. ඔහු බොරුකාරයෙකු බව ප්‍රසිද්ධියේ හෙලිදරව් කිරීමට මට නැවත නැවතත් හැකි වූ අතර අනෙකුත් සමහර හේතුවාදීන්ට ද එය හැකි විය. එහෙත් ඔහුගේ දේශපාලන ආරක්ෂකයින් නිසා ඔහු ජනතා බුද්ධියට කල අපරාධය සම්බන්ධව කිසිදාක වගකීමක් දැරුවේ නැත. ඔහු චෝදනා ලද වෙනත් අපරාධ සම්බන්ධව ද පියවරක් ගැනුනේ නැත. ඔහු කළායි සැළකෙන ලිංගික අපචාර සහ මිනී මැරුම් සම්බන්ධ බොහෝ නඩු පිළිබඳව ද මෙතෙක් පරීක්ෂණ පවත්වා නැති විට ඔහුගේ අධිරාජ්‍යයෙහි මුල්‍යමය රහස් පිළිබඳව කතා කිරීම ද නිශ්ඵලය.

සත්‍ය සායි බාබා තරයේම කියා සිටියේ තමා දෙවියෙකු බවයි. විශ්වයේ මැවුම්කරු බවයි. පුංචි පුංචි ''හාස්කම්'' මගින් ඔහු තමාගේ දිව්‍යමය ස්වභාවය ''සනාථ'' කළේය. ගම්බද තන්ත්‍රවාදියෙකුගේ පුතෙකු වූ නිසා ඔහුට ඔවුන්ගේ වෘත්තියට අයත් අත්විජ්ජා සහ ප්‍රයෝග පිළිබඳව දැනුමක් තිබිණි. එසේ වුවද ඔහු තම ප්‍රයෝගකාරී රඟදැක්වීම් මගින් දුප්පත් සහ නූගත් ගැමියන් පමණක් මෝහනය කිරීමට සීමා වුයේ නැත. කල්යාමේදී ඉන්දියාවේ ධනවත් සහ බලවත් ප්‍රභූ ජන සමූහයක් ආකර්ශනය කර ගැනීමට ඔහු සමත් විය. ඔවුන් අතර ඇමතිවරු, අගමැතිවරු, ජනාධිපතිවරු, අගවිනිසුරුවරු, ඉහළ කර්මාන්තකරුවන් සහ සුපිරි තරු සිටියහ.

සත්‍ය සායි බාබාගේ ක්‍රියාකාරිත්වයේ අමුතු ක්‍රමවේදයක් තිබුණි. එය ඔහුගේ විශ්මිත ජයග්‍රහණයේ වැදගත්ම සාධකය සේම ඔහුගේ දැවැන්ත බලයේ මුලය ද විය. ඉහළ සමාජයට අයත් ඔහුගේ බැතිමත්තු තමතමන්ගේ පෞද්ගලික කාරණා ඉටුකර ගැනීමට පැමිණියහ. සමහරු පැමිණියේ කැපී පෙනෙන චරිත සමඟ උරෙනුර ගැටී සිටීමටය. බොහෝ දෙනා ඊට සම්බන්ධ වුයේ දේශපාලන පද්ධතිය පුරාම අඬු විහිදවා සිටි බලසම්පන්න ජන සභාවක් ලෙස එය ක්‍රියාකළ නිසාය. එය ඉහළ රැකියා අවස්ථා ලබාගැනීමේ සහ නොයෙක් කාරණා ඉටුකරගැනීමේ මාර්ගයක් විය. තවත් අය මුල්‍යමය ආධාර අපේක්ෂා කළහ. එහෙමත් නැත්නම් නීති විරෝධීව උපයාගත් කළු සල්ලි වලින් බේරීමට පැමිණියහ. විදේශ බැතිමතුන් සහ විදේශ ශාඛා උපයෝගි කරගනිමින් කළ කළු සල්ලි සුදු කිරීමේ ලොන්ඩරි ක්‍රියාව මත සායි අධිරාජ්‍යය පදනම් වී ඇති බව කියවේ. ඇත්තෙන්ම සංසන්දනාත්මකව බලන කල ප්‍රමාණයෙන් විශාල නොවූ ක්‍රියාකාරී විදේශික බැතිමතුන් සහ සමහර අවස්ථාවල පෞද්ගලික නිවාසවල පිහිටුවා ඇති බොහෝ විට ඉතා දුබල විදේශීය ශාඛා ගැන

සැළකීමේදී සායි බාබාට ලැබෙන දැවැන්ත විදේශ ආධාර ඉදිරියෙන් සිටී. සායි බාබා තෙළිඟු බස හැර වෙන කිසිම බසක් කතා නොකිරීම පුදුමයට කාරණාවක් නොවේ. ඔහු තම ජීවිත කාලයටම විදේශ සංචාරයක යෙදී ඇත්තේ එකම එක් වරක් පමණකි. ඒ ඔහුගේ මිතුරු උගන්ඩාවේ ඉඩි අමීන් හමුවීම සඳහාය.

සායි බාබාගේ 80 වෙනි උපන්දිනයේදී ඔහු හාස්කම් දක්වන්නෙකුගේ භූමිකාවේ සිට ජනහිතකාමියෙකුගේ භූමිකාවට වෙනස්වන බව ඔහුගේ ආධාරකරුවෝ ප්‍රකාශ කළහ. ඒ මා විසින් ඔහු කළ හාස්කම් නිතරම රූපවාහිනී දර්ශන මගින් කර පෙන්වීමෙන් පසුව සහ බොහෝ වීදි ළමුන් ඒවා අනුකරණය කිරීමෙන් පසුවය. එතැන්පටන් ඔහු මුලාවූ ජනතාව රවටා උපයාගන්නා ලද මහා ධනස්කන්ධයෙන් කොටසක් ඔහුගේ පාරම්පරික ගමේ සමාජ සංවර්ධනය උදෙසා වියදම් කිරීම ඔහු සාන්තුවරයෙකු ලෙස පෙන්වීම සඳහා ඉස්මතු කෙරේ. එහෙත් දුප්පතුන් සඳහා ඉදිකෙරුණු පානීය ජල ව්‍යාපෘති, පාසල් සහ රෝහල් හැමවිටම ප්‍රයෝජනවත්ය. කළ වැරදි මකා ගැනීමට කරන මෙවැනි සමාජ සේවාවන් මාෆියා ලොක්කන්ගෙන් පවා සිදුවීම අලුත් දෙයක් නොවේ. ඔහු ඉන්දියන් සමාජයට කර ඇති හානිය සහ ඔහු සිදුකල අපරාධවලට ඒවා හිලව් කිරීමට නොහැකිය.

2005 දෙසැම්බර් වලදී සායි බාබාගේ ප්‍රබල ආධාර කරුවෙකු වූ එවකට ජනාධිපති ධූරය දැරූ ආචාර්ය අබ්දුල් කාලාම් වෙත මම ලිපියක් යැවීමි. කිසිදිනක එයට පිළිතුරු ලැබුනේ නැත. සායි බාබාට එරෙහිව අපරාධ පරීක්ෂණයක් කළ යුතු යැයි මම එමගින් ඉල්ලා සිටියෙමි. ඔහුගේ සමාජ සංවර්ධන ව්‍යාපෘතිවලින් අදහස් වන්නේ කරන ලද පව් හා අපරාධ මකා ගැනීම බවත් එම ක්‍රියාමාර්ගය පිළිගත නොහැකි බවත් වැඩි දුරටත් ලිව්වෙමි.

සායි බාබාට එරෙහිව හොඳ පදනමක් ඇතිව ඉදිරිපත් කල චෝදනාත් බොහෝ කීර්තිමත් සාක්කිකරුවනුත් පරීක්ෂණයකින් තොරව නොසලකා හැරීම ඉන්දියාවට ලැජ්ජාවකි. කසාවත අපරාධයක් කරන විට නීතිය ක්‍රියාත්මක නැද්ද? ඉන්දියාවේ ප්‍රජාතන්ත්‍රවාදය වහිළුවට ලක් කරමින් දේශපාලනමය ආරක්ෂණවාදය එඩිතරව හිස ඔසවන විට අප එය ඉවසා සිටිය යුතුද?

සත්‍ය සායි බාබා ඉන්දියාවට විශාල හානියක් කර තිබේ. ඔහුගේ වගකීමක් නැති දේශපාලන අනුගාමිකයන් ඉන්දියාවේ දේශපාලන සංස්කෘතිය දූෂණය කර තිබේ.

සත්‍ය සායි බාබාගේ බලපෑමෙන් ධෛර්යමත් වුණු අලුත් හාස්කම් වෙළඳුන් කණ්ඩායමක් ඔහු අනුකරණය කළහ. සත්‍ය සායි බාබා නොසිටියානම් ඉන්දියාව වඩා යහපත් දේශයක් වනු ඇත.

සිංහලට නැගුවේ - ආර්. ඩී. සැම්සන්